# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>තනතුර : පෞද්ගලික ලේකම් - JLM</u>**

**I. (අ) යෝග්‍යතාවය**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් පෞද්ගලික ලේකම්කරණය පිළිබඳ ඩිප්ලෝමාවක්/ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමාව කාල සීමාව අවම වශයෙන් වසර එක (01) ක් විය යුතුය)

**සමඟ**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක පෞද්ගලික ලේකම් තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද.

**(ආ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 5 : 0 (JLM) |
| ආරම්භක වැටුප | : | රු. 75,065/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,440/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 170,000/= පමණ වේ

**සටහන I** : ලිපි සකස් කිරීම, වාර්තා කෙටුම්පත් කිරීම සමඟ ඉංග්‍රීසි සහ සිංහල භාෂාව චතුර ලෙස හැසිරවීමේ හැකියාව සහ වෙනත් සියළුම ලේකම්කරණය කටයුතු ස්වාධීනව ඉටුකිරීමේ හැකියාව සහිත ස්වයං අභිප්‍රේරණාත්මක අයෙකු විය යුතුය.

**සටහන II** : පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය වේ.

**සටහන III** : ලිඛිත හා හෝ / ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**වයස් සීමාව** : වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක සහ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් කොට්ඨාශය - විධායක අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළුපිටියේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-07-14 වන දිනට පෙර **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**<u>අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**